- දුවේ පුතේ''
- නිවසේ අය එක්ක මෙය ක්‍රීඩාවක් ලෙස කරන්න.

යාළුවෝ : සීයේ, සීයේ පොල් ගෙඩියක් කඩා ගන්න ද?
පවනි : එපා . . . එපා . . .
යාළුවෝ : නැට්ට නං කැරකෙවුවා.
පවනි : හා එහෙනම් එකක් කඩා ගන්න.
යාළුවෝ : දඩීරියං . . . බිඩීරියං
(යාළුවන් පොල් ගෙඩි ඔක්කොම කඩන ආකාරයට ශබ්ද කරමින් අත් ඉවතට ගත්තා)
යාළුවෝ : සීයේ, සීයේ පොල් ලෙලි ගහන්න ද?
පවනි : එපා . . . එපා . . .
යාළුවෝ : පොඩ්ඩක් ලෙලි ගැහුවා .
පවනි : හා එහෙනම් ඔක්කෝම ලෙලි ගහන්න.
(යාළුවෝ පොල් ලෙලි ගසන ආකාරය පෙන්නුවා.)
යාළුවන් : සීයේ, සීයේ පොල් බිඳින්න ද ?
පවනි : එපා . . . එපා . . .
යාළුවෝ : පොඩ්ඩක් බින්දා
පවනි : හා එහෙනම් ඔක්කොම බිඳින්න.
(යාළුවන් පොල් බිඳින ආකාරය පෙන්නුවා.)
යාළුවෝ : සීයේ, සීයේ පොල් වතුර බොන්න ද ?
පවනි : එපා . . . එපා . . .
යාළුවෝ : පොඩ්ඩක් බිවුවා.
පවනි : හා එහෙනම් ඔක්කොම බොන්න. (යාළුවන් වතුර බොනවා වාගේ පෙන්නුවා.)
යාළුවෝ : සීයේ, සීයේ පොල් ගාන්න ද ?
පවනි : එපා . . . එපා . . .
යාළුවෝ : පොඩ්ඩක් ගෑවා.
පවනි : හා එහෙනම් ඔක්කොම ගාන්න.
යාළුවෝ : ජිංජි බරස් බරස් බරස්
(යාළුවන් දණහිස නවා අත් දෙක එකතු කර පොල් ගාන ආකාරය රඟපෑවා.)
යාළුවෝ : සීයේ, සීයේ පොල් මිරිකන්න ද?
පවනි : එපා . . . එපා . . .
යාළුවෝ : පොඩ්ඩක් මිරිකුවා.
පවනි : හා එහෙනම් ඔක්කොම මිරිකන්න.
යාළුවෝ : මිටි කිරි කිරි - දිය කිරි කිරි
ඉඳා කපුටො පොල් කුඩු.
(යාළුවන් පොල් මිරිකා කුඩු ඉවතට විසි කරන ආකාරය පෙන්නුවා

පවනි : මම එහෙනම් නාගෙන එන්නම්.
යාළුවෝ : හා හොඳයි සීයේ
(පවනි ටික දුරක් ගොස් ආපසු යහළුවන් වෙත ආවා.)
පවනි : කෝ පොල් කිරි ටික ?
යාළුවෝ : උඩහ ගෙදර බල්ලා බීවා.
පවනි : උඩහ ගෙදර බල්ලා කෝ ?
යාළුවෝ : ළිඳට පැන්නා
පවනි : ළිඳ කෝ ?
යාළුවෝ : ගොඩ කළා
පවනි : ගොඩ කෝ ?
යාළුවෝ : තම්පළා හිටෙවුවා
පවනි : තම්පළා කෝ ?
යාළුවෝ : රජ්ජුරුවන්ගේ ගොනා උඩිං උඩිං කෑවා
මගේ ගොනා යටිං යටිං කෑවා
පවනි : තම්පළා කාපු හොම්බ කෝ ?
යාළුවෝ : මේ තියෙන්නේ.
(යාළුවන් තම තමාගේ නිකට පෙන්වා දුවන්නට පටන් ගත්තා.)

- **මෙහි කැමැති අවස්ථාවක් චිත්‍රයට නගන්න**